රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2024

මගේ අංකය : සීඑල්එස්/ විශේෂ උසස් /2021
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2024.11.08

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අංක 2024/35 දරන 2017.06.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව පුස්තකාලයාධිපති සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

අංක 2024/35 දරන 2017.06.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව පුස්තකාලයාධිපති සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පුස්තකාලයාධිපති I වන පන්තියේ / ශ්‍රේණියේ පහත සඳහන් පරිදි සුදුසුකම් ලබන ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ, **සක්‍රීය සේවයේ නියුතු** පුස්තකාලයාධිපතිවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සුදුසුකම්

i. I ශ්‍රේණියේ/ පන්තියේ පුස්තකාලයාධිපති තනතුරක අවම වශයෙන් වසර (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ම උපයාගෙන තිබීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020, 1/2020(I) හා 1/2020(II) අනුව විනය දඬුවම් ලබා නොතිබිය යුතුය.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර 05 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම. ( ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආශ්‍රය සාමාජිකත්වය ලබා තිබීම)

***සටහන*** *:-* මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ දිනට I පන්තියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් තහවුරු කර ගනු ලැබේ. ඉන් අනතුරුව එම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ හා කුසලතාවයේ අනුපිළිවෙළ මත සහ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණ දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

04. *(අ) සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්*

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| **සේවා පළපුරුද්ද**<br>අදාළ මූලික සුදුසුකම් ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය | 50 | අදාළ නොවේ |
| **කුසලතාවය**<br>අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටිය අනුව කුසලතාවය තීරණය කරනු ලැබේ. | 45 | |
| **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය** | 05 | |
| **එකතුව** | 100 | |

*(ආ) ලකුණු ලබා දීමේ ක්‍රමවේදය*

- **සේවා පළපුරුද්ද**

I. සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට (අවුරුදු 05) අමතරව වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට එම ලකුණු ප්‍රමාණයට සමානුපාතික වන ලෙස ඔවුන්ගේ අමතර සේවා කාලයන් සඳහා ගණනය කරන ලද ලකුණු ප්‍රමාණයක් ද ලබාදෙනු ලැබේ. ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදෙන ආකාරය ඇමුණුම - I මගින් දැක්වේ.

- **කුසලතාවය**

II. කුසලතාවය සඳහා ලකුණු ප්‍රමාණය 45 කි. කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ආකාරය ඇමුණුම - I මගින් දැක්වේ.

III. සම්මුඛ පරීක්ෂණයේ දක්වනු ලබන කුසලතාවය සඳහා මුළු ලකුණු ප්‍රමාණය 05 කි. එම සම්මුඛ පරීක්ෂණයේදී කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ආකාරය ඇමුණුම - I මගින් දැක්වේ.

05. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.3.1.2 වගන්තිය මගින් දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව, අයදුම්කරුවන් විසින් මූලික සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබීම හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය සැලකිල්ලට ගෙන සම්මුඛ පරීක්ෂණ දින සිට විශේෂ ශ්‍රේණියට උසස් වීම් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ දිනට සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන්ගේ පමණක් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

06. මෙම උසස්වීම සම්මුඛ පරීක්ෂණ දින සිට බලාත්මක වේ.

07. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අයත් උසස් වීමට මූලික සුදුසුකම් ඇති සියලුම නිලධාරීන් මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්පතෙහි දක්වා ඇති විස්තර නිවැරදි බවට සහතික කර අයදුම්කරුගේ උප්පැන්න සහතිකය, පත්වීම් ලිපිය, ස්ථිර කිරීමේ ලිපිය, උසස්වීම් ලිපි, අධ්‍යාපන සහතික හා සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පිටපත් ද සමග තම අමාත්‍යාංශ ලේකම්ගේ ද නිර්දේශ සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024.12.13** වේ.

09. කරුණාකර මෙහි සඳහන් කරුණු අදාළ නිලධාරීන්ට දැනගැනීමට සලස්වන්න.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

දුරකථන : 0112- 699966
ෆැක්ස් : 0112- 690100
විද්‍යුත් ලිපිනය : gov.librarianservice@gmail.com

**<u>පුස්තකාලයාධිපති සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබා දීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටිය</u>**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | එක් එක් ශීර්ෂය යටතේ ලබාදෙන උපරිම ලකුණු |
|---|---|
| **01.ජ්‍යෙෂ්ඨතාවය සඳහා**<br><br>සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට (අවුරුදු 05) අමතරව වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට එම ලකුණු ප්‍රමාණයට සමානුපාතික වන ලෙස ඔවුන්ගේ අමතර සේවා කාලයන් සඳහා ගණනය කරන ලද ලකුණු ප්‍රමාණයක් ද ලබාදෙනු ලැබේ.<br><br><u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා, වෙන් කර ඇති උපරිම ලකුණු</u><br><br>වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය X නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 |
| **02. කුසලතාවය සඳහා**<br><br>***( උපරිම ලකුණු ලැබෙන සුදුසුකම් පමණක් සලකනු ලැබේ. )*** | 45 |
| **2.1 පශ්චාත් උපාධි සුදුසුකම්**<br><br>2.1.1 පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - (**ලකුණු** 15) - ( කාලය - වසර 02 ක් සහ පර්යේෂණයක් ඇතුළත් විය යුතුය.<br><br>2.1.2 පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ( **ලකුණු** 10 )<br><br>**සැ.යු - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හෝ මෙම ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි පිරිනැමීම සඳහා සුදුසු යැයි පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් විය යුතුය.** | 15 |

| | |
|---|---|
| **2.2 වෘත්තීය සුදුසුකම්**<br><br>2.2.1 ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පූර්ණ සාමාජිකත්වය ලබා එම සාමාජිකත්වය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන වසරකට ලකුණු 02 බැගින් උපරිම වසර 05 දක්වා ලකුණු ලබාදෙනු ලැබේ. | 10 |
| **2.3 පරිගණක විද්‍යාව පිළිබඳ සුදුසුකම්**<br><br>2.3.1 පරිගණක විද්‍යා ඩිප්ලෝමාව - ( **ලකුණු 10** )<br><br>(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ආයතනයකින් හෝ ලබාගත් ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමේ හෝ පැය 1500කට නොඅඩු පරිගණක ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ මට්ටමක පාඨමාලාවක් හදාරා තිබීම හා වසරක් හෝ වසරකට වැඩි අධ්‍යයන කාලසීමාවක් සපුරා තිබීම )<br><br>2.3.2 පරිගණක විද්‍යා සහතිකය - ( **ලකුණු 05** )<br><br>(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය කුසලතා (NVQ) 04 වන මට්ටමේ පාඨමාලවක් හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් සපුරා තිබීම )<br><br>2.3.3 පුස්තකාල මෘදුකාංග පිළිබඳ ලබා ඇති පළපුරුද්ද - ( **ලකුණු 02** )<br><br>***( එක් පද්ධතියක් සඳහා ලකුණු 02 බැගින් හිමිවේ. )*** | 10 |
| **2.4 නවෝත්පාදන/ ප්‍රකාශන**<br><br>2.4.1 නවෝත්පාදන -<br>• ඒකල - **(ලකුණු 02)**<br>• කණ්ඩායම් - **(ලකුණු 01)**<br><br>**2.4.2** පර්යේෂණ ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා ( උපාධි / පශ්චාත් උපාධි සඳහා අදාළ කරගත් පර්යේෂණ හැර )<br>• ඒකල - ( **ලකුණු 02** )<br>• කණ්ඩායම් - ( **ලකුණු 01** )<br><br>**සැ.යු - ( එම ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක / ජර්නලයක ප්‍රකාශයට පත්කර තිබිය යුතුය. )** | 10 |

| | |
|---|---|
| 2.4.3 වාර්තා / ලිපි<br>• ඒකල - ( **ලකුණු 01** )<br>• කණ්ඩායම් - ( **ලකුණු 0.5** )<br>**සැ.යු - ( ඉහත ලේඛන පුස්තකාලයාධිපති සේවයට හෝ පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යා විෂයය ක්ෂේත්‍රයට අදාළව මුද්‍රිත මාධ්‍යයක හෝ පිළිගත් විද්‍යුත් මාධ්‍යයක ප්‍රසිද්ධියට පත් කරන ලද ඒවා විය යුතුය. )** | 05 |
| **03. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා :**<br>a) නායකත්වය - ලකුණු 02<br>b) සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>c) පෞරුෂත්වය - ලකුණු 01 | |
| **මුළු ලකුණු** | 100 |

## ආදර්ශ අයදුම්පත්‍රය

**<u>අංක 2024/35 දරන 2017.06.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව පුස්තකාලයාධිපති සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය</u>**

1. සේවා ස්ථානය

   I. අමාත්‍යාංශය : ........................................................................................................................

   II. දෙපාර්තමේන්තුව : ........................................................................................................................

   III. උප කාර්යාලය : ........................................................................................................................

2. නිලධාරියාගේ/ නිලධාරිනියගේ සම්පූර්ණ නම : ..........................................................................................

   ........................................................................................................................ මයා / මිය / මෙනවිය

3. මුලකුරු සමග නම : ........................................................................................................................

4. නම වෙනස්කර ඇත්නම් සංශෝධිත නම : ..........................................................................................

   ........................................................................................................................

5. උපන් දිනය : ............................................ 6. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

7. ස්ථිර පෞද්ගලික ලිපිනය : ........................................................................................................................

........................................................................................................................

8. දුරකථන අංකය ( පෞද්ගලික ) : ..............................................................

   ( කාර්යාලයීය ) : ..............................................................

9. පුස්තකාලයාධිපති තනතුරට මුලින්ම පත් වූ දිනය ( III පන්තියට ) : ...............................................

   I. පත්වීම් ලිපියේ අංකය : ..................................................................

10. ඔබ සේවය ස්ථිර කර තිබේද? : ඔව් / නැත

   I. ස්ථිර කළ දිනය : ..................................................................

11. පුස්තකාලයාධිපති II පන්තියට / ශ්‍රේණියට පත්වූ දිනය : ..........................................................................

12. පුස්තකාලයාධිපති I පන්තියට / ශ්‍රේණියට පත්වූ දිනය : ..........................................................................

13. අංක 2024/35 දරන 2017.06.21 දිනැති සේවා ව්‍යවස්ථාවේ 10.3 පරිච්ඡේදයේ හා පස්වන පරිශිෂ්ටයේ දක්වා ඇති පරිදි සපුරා ඇති සුදුසුකම් ( ඇමුණුම 01 ) :

   I. කුසලතාවය : ........................................................................................................................

- පශ්චාත් උපාධි සුදුසුකම් : සපුරා ඇත ☐ සපුරා නැත ☐
- ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය : ආශ්‍රය සාමාජිකත්වය ලැබූ දිනය - ..........................................

  ආශ්‍රය සාමාජිකත්වය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන වසර ගණන - ..............................................
- පරිගණක විද්‍යාව පිළිබඳ සුදුසුකම් : ..........................................................................................................
- ප්‍රකාශන හා නවෝත්පාදන : ඒකල ☐ කණ්ඩායම් ☐

  ප්‍රකාශනය පිළිබඳ තොරතුරු :-

  ..........................................................................................................................................

  ..........................................................................................................................................

  ..........................................................................................................................................

14. I. 1997.08.01 දින සිට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවට
    - අන්තර්ග්‍රහණය වී ඇත ☐
    - අන්තර්ග්‍රහණය වී නැත ☐
    - අදාළ නොවේ ☐

    II. 2009.09.02 දින සිට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවට
    - අන්තර්ග්‍රහණය වී ඇත ☐
    - අන්තර්ග්‍රහණය වී නැත ☐
    - අදාළ නොවේ ☐

    III. 2016.08.09 දින සිට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවට
    - අන්තර්ග්‍රහණය වී ඇත ☐
    - අන්තර්ග්‍රහණය වී නැත ☐

15. I පන්තියේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ වන දිනය: ..............................................................

16. ..........................................................................................................................................

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ පුස්තකාලයාධිපති සේවයේ I පන්තියේ / ශ්‍රේණියේ

නිලධාරියෙකු / නිලධාරිනියක වශයෙන් සේවය කරන ..........................................................................

..........................................................................................(සම්පූර්ණ නම) වන මා විසින් ඉහත සඳහන් කර

ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අංක 2024/35 දරන 2017.06.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ

පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව

විශේෂ ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලබන බව ප්‍රකාශ කරමි.

දිනය: ....................................................... අත්සන: ..............................................................

# <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

..........................................................................................................අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ I පන්තියේ / ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරක් දරන ...........................................................

........................................................................................................................ මහතා / මහත්මිය / මෙනෙවිය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ 1 සිට 16 දක්වා වූ තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා / නිලධාරිනිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.

1. නිලධාරියා / නිලධාරිනිය විසින් චක්‍රලේඛයේ අංක 02 මගින් දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන දිනය :

   ..............................................................................................................................................................

2. නිලධාරියා / නිලධාරිනිය තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේද? ..................................................

3. නිලධාරියා / නිලධාරිනිය I පන්තියට / ශ්‍රේණියට උසස් වූ පසු ලබාගෙන ඇති අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු විස්තර:

| **අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබාගත් කාලසීමාව** | **දින ගණන** | | | **හේතුව** |
|---|---|---|---|---|
| | **වර්ෂ** | **මාස** | **දින** | |
| | | | | |
| | | | | |
| | | | | |

4. උසස්වීම සඳහා ඉල්ලුම් කරනු ලබන දිනට නිලධාරියා / නිලධාරිනිය ඒකාබද්ධ සේවයේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවය කළ, සම්පූර්ණ සේවා කාලය :

   අවු: ............. මාස: .............. දින: ................

5. උසස්වීම සඳහා ඉල්ලුම් කරනු ලබන දිනට I පන්තියේ / ශ්‍රේණියේ සේවා කාලය :

   අවු: ................ මාස: .................. දින: ..................

6. නිලධාරියා / නිලධාරිනිය I පන්තියට / ශ්‍රේණියට උසස් වූ පසු සියලුම වැටුප් වර්ධක උපයාගෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? :
   ( I පන්තියට / ශ්‍රේණියට උසස් වූ පසු 2022.12.31 දින දක්වා කාලසීමාව තුළ )

   ***නිලධාරියා / නිලධාරිනිය සපුරා ඇති කාලසීමාව අනුව වගුව සකස් කර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න**

| **අනු අංකය** | **වැටුප් වර්ධක දිනය** | **උපයාගත් වැටුප** | **වැටුප් වර්ධක වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවේ ප්‍රමාණනකරුගේ නිර්දේශය*** | | | |
|---|---|---|---|---|---|---|
| | | | **ඉතා හොඳයි** | **හොඳයි** | **සතුටුදායකයි** | **අසතුටුදායකයි** |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

*( *අදාළ කොටුව තුළ √ යොදන්න. )*

7. නිලධාරියා / නිලධාරිනිය ඒකාබද්ධ සේවයේ පුස්තකාලයාධිපති සේවයේ I පන්තියට / ශ්‍රේණියට පත් වූ පසු මේ දක්වා නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද? ......................................

7.1 එසේනම් අදාළ තොරතුරු :-

I. වරදේ ස්වභාවය ( උපලේඛන I හෝ II අනුව ): ......................................................................

II. දෙන ලද දඬුවම හා දඬුවමෙහි ස්වභාවය: ..........................................................................

..........................................................................................................................

III. වැටුප් වර්ධක විලම්භනය කර තිබේනම් එම වර්ෂයන් : .................................................................

| කාලසීමාව | දින ගණන | | | හේතුව |
|---|---|---|---|---|
| | වර්ෂ | මාස | දින | |
| | | | | |
| | | | | |
| | | | | |

**8. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

........................................... දින සිට මෙම නිලධාරියා / නිලධාරිනිය විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. /නොකරමි.

දිනය : ......................................    දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන : ...................................

නම :

තනතුර :

නිල මුද්‍රාව :

**9. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :**

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් සඳහන් කර ඇති නිර්දේශය මවිසින්ද නිර්දේශ කරමි.

දිනය : .....................................    අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන : ....................................

නම :

තනතුර :

නිල මුද්‍රාව :